## ලංසු කැඳවීම

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, කොළඹ පාර,සීදූව.

## 2026/2027 වසර සඳහා අමු ආහාර ද්‍රව්‍ය සැපයීම

01. විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2026/2027 වසර වෙනුවෙන් රෝගීන් සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයට අවශ්‍ය අමු ආහාර අඛණ්ඩව සැපයීම සහතික කල හැකි සැපයුම්කරුවන්ගෙන් පහත වගුවේ සදහන් කාණ්ඩ 04ක් යටතේ වෙන වෙනම ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ ලංසු කැඳවනු ලැබේ.

02. මේ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ සරප් අංශය වෙත පහත වගුවේ සදහන් මුදල් ලංසු ලියවිලි ගාස්තු ලෙස ගෙවා ලබා ගත් ලදුපත සමඟ ලිඛිත ඉල්ලීමක් හා තම ජාතික හැඳුනුම්පත් පිටපතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2026.05.22.**වන දින සිට **2026.06.05** වන දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ කාර්යාලය වෙතින් ලංසු ලියවිලි ලබා ගත හැකිය.

03. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වලංගු කාලය කාණ්ඩ අංක 1 සහ 3 සඳහා දින 77ක් ද කාණ්ඩ අංක 02 සහ 04 සඳහා දින 49ක කාලයකට ද වලංගු වන සේ ඉදිරිපත් කල යුතුය.

04. අදාළ ආහාර ඇස්තමේන්තුව පිළිබඳ විස්තර ලංසු ආකෘතිපත්‍ර සමඟ නිකුත් කරනු ලැබේ.

| අනු අංකය | ප්‍රසම්පාදනය | ලංසු ලියවිලි ගාස්තුව අගය (රු) | ලංසු ඇපකර වටිනාකම අගය (රු) | ලංසු ඇපකරයේ වලංගු කාලය |
|---|---|---|---|---|
| 01 | නැවුම් එළවළු හා පළතුරු සැපයීම | 1000 | 62,350.80 | 105 |
| 02 | මස් හා බිත්තර සැපයීම | 1000 | 18,900.00 | 77 |
| 03 | වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම | 1000 | 67,353.00 | 105 |
| 04 | ඇසුරුම් කළ ආහාර ද්‍රව්‍ය සැපයීම | 1000 | 15,336.00 | 77 |

05. ඉහත වගුවෙහි සඳහන් මිල ගණන් පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, කොළඹ පාර, සීදූව ලිපිනයෙහි වූ **සභාපති, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල** නමට ලියන ලද ලංසු බැඳුම්කරයක් ලංසු භාර ගැනීම අවසන් වූ දින සිට ඉහත සඳහන් වගුවේ කාලසීමාවන්ට වලංගු වන සේ ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විජය කුමාරතුංග අනුස්මරණ රෝහල සඳහා අමු ආහාර ද්‍රව්‍ය සැපයීම 2026/2076"** යනුවෙන් පැහැදිලිව සටහන් කොට **2026.06.05** දින

පෙ.ව.10.00 හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, කොළඹ පාර, සීදූව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයේ පිහිටි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කල යුතුය.

07. **2026.06.05** දින පෙ.ව. 10.00ට ලංසු භාර ගන්නා වේලාව අවසන් වූ වහාම ලංසු අයදුම්පත් විවෘත කරනු ලැබේ. ලංසු අයදුම්පත් විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අසම්පූර්ණ ලංසු අයදුම්පත් හා අමුණා එවනු ලබන ලේඛනගත සාක්ෂි නිසි පරිදි සහතික නොකළ ලංසු අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. අදාළ ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

10. ලංසු ලියවිලි මුදල් ගෙවීමකින් තොරව විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ කාර්යාලයේදී සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී පරීක්ෂා කිරීමට හැකිය.

**11.අනු අංක 1 සිට 04 දක්වා වෙන වෙනම ලංසු කැඳවන අතර කැමති ලංසුකරුවන්ට ප්‍රසම්පාදන 04 ටම හෝ කිහිපයකට (අනු අංක 01 සිට 04 දක්වා ) වුවද මිල ගණන් වෙන වෙනම ඉදිරිපත් කල හැක.**

12.මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ ගණකාධිකාරී / පරිපාලන නිලධාරි වෙතින් ලබාගත හැකිය. (දුරකථන අංක 011 2258862 - 4)

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,
කොළඹ පාර,
සීදූව.